**ගාල්ල මහා නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 25 දින නාගරික කොමසාරිස්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.422,218 ක් වූ ආයුර්වේද තොගයේ වටිනාකම සහ ආපසු ගෙවිය යුතු රු.384,540 ක් වූ සේවක ඇප තැන්පත් පොලිය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු එකතුව රු.99,959,831 ක් වූ දායක මුදල් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් හා සේවකයින් 33 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු දින 498 ක් වෙනුවෙන් අයවිය යුතු රු.950,562 ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.256,492,835 ක් වූ ගිණුම් විෂයයන් 15කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.63,115,643 ක අසමානතා විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම

2003 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.5 ලැබිය යුතු ගිණුම්

දිගු කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින ගිණුම් 07 කට අයත් එකතුව රු.43,331,342 ක් වූ ශේෂ හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.6 ගෙවිය යුතු ගිණුම් ශේෂ

2011 වර්ෂයේ සිට නිරවුල් කිරීමට පියවර නොගෙන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ රු.111,899 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.216,588,565 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනය ද, එකතුව රු.269,735,790 ක් වූ ණයහිමි ශේෂ හා රු.232,143,510 ක් වූ ණයගැති ශේෂ සම්බන්ධ ලේඛන, කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ද, එකතුව රු.74,522,480 ක් වූ අතැති තොගය සම්බන්ධ භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ උපලේඛන ද, රු.37,173,221 ක් වූ සේවක ණය සම්බන්ධ කාල විශ්ලේෂණ වාර්තා ද, එකතුව රු.96,846,605 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් සම්බන්ධව තැන්පත් ලේඛන, උපලේඛන, කාල විශ්ලේෂණ වාර්තා ද, රු.14,145,799 ක් වූ වෙනත් ආදායම් හා රු.626,740 ක් වූ අත්තිකාරම් සම්බන්ධව උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.8 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | වසර දෙකක කාලයක් ඉක්ම වූ එකතුව රු.48,809,693 ක ආපසු ගෙවිය යුතු තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාවට අයත් වාහන 85 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, ලොග් සටහන් පොත්ද පවත්වා නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු.1,027,415 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.43,967,186 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.40,584,412 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.84,551,598 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) විධිමත් පරිදි සේවකයන් බඳවා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේදී සභාවේ ආදායමින් රු.34,392,145 ක මුදලක් සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයන්ගේ වැටුප් හා දීමනා ගෙවීමට වැයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 92 ක් තරම් වූයෙන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය පාලනය දුර්වල තත්ත්වයක පැවතිණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් පහත විස්තර දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම | ආදායම් ආධාර මුදල් | ස්වයං මුළු උත්පාදන ආදායම | ස්වයං පුනරාවර්තන වියදම | උත්පාදන ආදායම ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
| --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 525,301,980 | 266,347,644 | 258,954,336 | 481,334,795 | 222,380,459 |
| 2014 | 326,641,101 | 165,582,100 | 161,059,001 | 367,225,514 | 206,166,513 |
| 2013 | 341,095,262 | 171,897,907 | 169,197,355 | 294,466,736 | 125,269,381 |

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සෑම වර්ෂයකම ආදායම් ආධාර ලැබීම් වල සහ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම් වලද වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ii) පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණි. නමුත් ඒ පිළිබඳව අවධානය යොමුකර වියදම් පාලනය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(iii) ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩි වී ඇති බව පෙන්නුම් කෙරුණි.

(iv) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට හැකියාවක් නොලැබෙන බව පෙන්නුම් කෙරුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් හා බදු, බිම් බදු හා එළදා බදු, බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු මෙන්ම වෙනත් කුලී වල එකතුව රු.115,298,821 ක් ද, වර්ෂයේ බිල් කිරීම් වලින් රු.140,512,711 ක්ද අයවිය යුතුව තිබූ අතර, වර්ෂය තුළ ඉන් රු.101,936,708 ක් හෙවත් සියයට 39.8 ක අගයක් අයකර ගැනීමෙන් අයවීම් වල ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවැති බව නිරීක්ෂණය විය.

## 2.3.2 වරිපනම් බදු

-------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.115,102,938 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවති අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 50 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බදු එකතු කිරීමේ නිලධාරීන් 07 දෙනකුට සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.1,307,678 ක කොමිස් මුදල් ගෙවා තිබූ නමුත්, හිඟ බදු ශේෂයෙන් අයකරගෙන තිබුණේ සියයට 13 ක් තරම් අඩු අගයකි.

(ඇ) සභා බලප්‍රදේශයේ ඇති වරිපනම් කොට්ඨාශ 15 න් කොට්ඨාශ 12 ක් තුළ රු.50,000 ට වැඩි හිඟයක් පවතින පාරිභෝගිකයන් 130 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.20,362,914 ක හිඟ ශේෂයක් පැවතුණි.

## 2.3.3 බදුකුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ ආපන ශාලාව සඳහා බදුකරුවන් තිදෙනෙකුගෙන් රු.341,004 ක් ද, බස් නැවතුම්පොල ගොඩනැගිල්ල වෙනුවෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් රු.1,034,869 ක් හා රුහුණු බස් සමාගමෙන් රු.1,755,584 ක් ලෙස එකතුව රු.3,131,457 ක බදුකුලී මුදලක් අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට බදුකරුවන් 191 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.22,836,054 ක හිඟ කඩ බදු මුදල්ද, එළවළු වෙළඳපොල බදුකරුවන් 156 දෙනෙකුගෙන් එකතුව රු.845,819 ක හිඟ බදුකුලී මුදලක්ද අයවිය යුතුව පැවතුණි.

(ඇ) සභාව සතු කඩ කාමර තුනක් බදුගත් පුද්ගලයෙකුගෙන් රු.3,822,051 ක හිඟ බදු මුදලක් පැවැතියද, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.1,673,486 ක් වූ හිඟ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඊට අදාළ උපලේඛන ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3.4 බලපත්‍ර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,894,595 ක හිඟ බලපත්‍ර ආදායමක් නිරීක්ෂණය වූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 73 ක වර්ධනයක් විය.

**2.3.5 වෙනත් ආදායම්**

**-------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වෙනත් ආදායම් ශේෂය රු.27,572,424 ක් වූ අතර, බදුකරුවන් දෙදෙනෙකුගේ අයවිය යුතු එකතුව රු.176,176 ක් වූ හිඟ රථ ගාල් ගාස්තු ශේෂය වර්ෂ තුනක කාලයක්ද ඉක්මවා තිබුණි.

**2.3.6 විනෝද බදු**

-------------

2007 වර්ෂයේ සිට පැවත එන රු.12,478,059 ක් වූ හිඟ විනෝද බදු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.3.7 ඉඩම් බදුදීම**

--------------

**(i) බටදූව බෝගහවත්ත නාගරික ඉඩම බදුදීම**

-----------------------------------------------

සභාවට අයත් බටදූව බෝගහවත්ත නැමැති ඉඩම පෞද්ගලික සමාගමකට රු.150 ක මාසික බදු කුලියකට පළමුව වසර 30 ක කාලයක් සඳහාද, එම කාලය අවසන් වීමෙන් අනතුරුව තවත් වසර 30 ක් සඳහා පෙර බදු ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි යටතේම ගිවිසුම දීර්ඝ කිරීමටද, පළමු බදු ගිවිසුමෙන් එකඟ වී තිබුණි. එහෙත් බදු මුදල සංශෝධනය කිරීමට අදාළ කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

**(ii) කොටුව පෙඩ්රල් වීදියේ පිහිටි ඉඩම බදු දීම**

-------------------------------------------------

සභාව විසින් භුක්ති විඳින අංක 64 හා 64(ඒ) දරන පර්චස් 42.5 ක් වූ ඉඩම ඉදිකිරීම, පවත්වාගෙන යාම හා පැවරීමේ ක්‍රමයට 2015 ඔක්තෝබර් මස 01 දින සිට වසර 30 ක් සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබුණු නමුත්, ඒ සඳහා මහා නගර සභා ආඥා පනතේ 40(1)(ඊ)(1) වගන්තිය අනුව විෂය භාර අමාත්‍යවරයාගේ හෝ ජනාධිපතිවරයාගේ අනුමැතිය ලැබී නොතිබුණි. එමෙන්ම ඉඩමේ නිරවුල් අයිතිය මහා නගර සභාව සතු නොවන බව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබුණි.

**(iii) රත්ජන් ගොඩැල්ල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි බදුදීම**

**------------------------------------------------------------**

ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිල්ලේ වෙළඳපොල වටිනාකම ගැන නොසලකා බදු මුදල තීරණය කර, ඇගයීම් කමිටුවේ නිර්දේශ නොසලකා හැර වැඩිම එක්වන් මුදල ඉදිරිපත් කර තිබූ පුද්ගලයා ආයෝජකයා ලෙස තෝරාගෙන තිබුණි. බදුකරුගෙන් රු.7,770,000 ක එක්වන් මුදලක් අයකර ගෙන තිබුණු නමුත්, මහා නගර සභා ආඥා පනතේ 40(1)(ඊ)(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූල වී කටයුතු කර නොතිබුණි. ගාල්ල - කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් විසින් ගොඩනැගිල්ල කඩා ඉවත් නොකරන ලෙස කරන ලද ලිඛිත දැනුම් දීමද නොසලකා හැර කටයුතු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ස්ථාන මාරු වී ගිය සේවකයින් 45 දෙනෙකුගේ රු.2,576,181 ක ණය ශේෂ, විශ්‍රාම ගිය සේවකයින් 17 දෙනෙකුගේ රු.1,032,321 ක ණය ශේෂ සහ සේවයේ යෙදී සිටියදී මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.218,744 ක ණය ශේෂ අයවිය යුතුව තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලට ප්‍රමාද වී දායක මුදල් යැවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.371,100 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබූ නමුත්, මේ පිළිබඳව මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන ඔවුන් වෙත වගකීම් පවරා අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විධිමත් අනුමැතියක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.480,162 ක් වූ අගරු චෙක්පත් 03 ක වටිනාකම පොත් වලින් ලියාහැර තිබුණි.

(ඈ) දේපල තහනම් කිරීමේ නිලධාරීන්ට ගෙවා තිබුණු රු.4,223,612 ක කොමිස් මුදල ගණනය කළ ආකාරය, රැස්කරන ලද මුළු ආදායම සහ කොමිස් මුදල් ගෙවීම් කල බව තහවුරු කෙරෙන කිසිදු ලිඛිත තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 3.2 කාර්ය මණ්ඩල කළමනාකරණය

-----------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 39 දෙනෙකු බඳවාගෙන 2015 වර්ෂය සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.9,934,212 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) සභාවේ අනුමත කාර්යමණ්ඩලයට අයත් තනතුරු 04 ක පැවැති පුරප්පාඩු 81 ක් සම්පූර්ණ කර ගැනීමට හා තනතුරු 03 ක් වූ අතිරික්ත 50 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 වාහන පාලනය

-----------------

සභාවේ 85 ක් වූ ප්‍රවාහන ඇණිය සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවේ දී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2014 දෙසැම්බර් 26 දිනැති අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූල නොවී, වාහන 70 ක රක්ෂණාවරණ පෞද්ගලික රක්ෂණ ආයතනවලින් ලබාගෙන තිබුණි.

(ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සභාව සතු වාහන වල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

(iii) සභාව සතුව තිබිය දී අස්ථාන ගතවී තිබූ වාහන 04 ක් පිළිබඳව සහ අංක 50 – 6418 දරන කැබ්රථයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට හෝ මූලික පරීක්ෂණ සිදුකිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.4 සභාවේ නිවාස**

----------------

සභාව සතු රජයේ නිවාස සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) රජයේ නිවාස 21 න් නිවාස 07 ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

(ii) ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 6.15 වගන්තියට අනුකූල නොවී නිලධාරීන් තිදෙනෙකුට නිවාස වල පදිංචි වීමට ඉඩකඩ සලසා දී තිබුණි. ඉන් එක් නිලධාරියකුගෙන් දණ්ඩන මුදල් අයකර ගැනීමට මෙන්ම, තවත් අයෙකුගෙන් 2000 වර්ෂයේ සිට හිඟව පවතින රු.61,410 ක හිඟ කුලී අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**3.5 ආදාහනාගාරය ඉදිකිරීම**

----------------------------

දඩල්ල කනත්තේ ද්විත්ව දහන කුටීර සහිත ආදාහනාගාරයක් ඉදිකිරීම සහ දහන කුටීර දෙකක් සවි කිරීම සඳහා 2014 වර්ෂයේ දී රු.16,718,187 ක වියදම් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ නොසලකා මෙම ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබා දී තිබුණි. 2014 අගෝස්තු 08 දින සිට 2016 අප්‍රේල් 27 දක්වා කාලපරිච්ඡේදය තුළ අංක 01 දරන කුටීරය දින 284 ක් හා අංක 02 දරන කුටීරය දින 391 ක කාලයක් අක්‍රීය වී පැවතුණි.

(ii) කොන්ත්‍රාත් සමාගම විසින් ගිවිසුමේ ඇතුළත් කොන්දේසි කඩකර උප බදුදීම් සිදුකර තිබූ අතර, ගිවිසුම් කාලය ඉක්මවීම වෙනුවෙන් දඩ මුදල් අයකර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(iii) ඉදිකිරීම් දෝෂයන් නිසා දහන කුටීර ක්‍රියාකරවීමට නොහැකි තත්ත්වයක පවතින බව ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය විසින් දක්වා තිබුණි.

## 3.6 හඳුනාගත් අලාභ

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෝඩ ඇල පොම්පාගාරයේ රු.2,561 ක විදුලි බිල්පත නොගෙවීම නිසා විසන්ධි කර තිබුණු විදුලිය සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා රු.39,164 ක අමතර ගාස්තුවක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) 1985 ජනවාරි සිට 2008 දෙසැම්බර් දක්වා කාලයට අදාළව දේපල තහනම් කිරීමේ නිලධාරීන් 13 දෙනෙකුට හිඟ අර්ථසාධක දායක මුදල් ගෙවීමේදී සේවක දායකත්වය වන එකතුව රු.357,676 ක මුදල හා අධිභාර වශයෙන් එකතුව රු.1,286,095 ක මුදලක් සභාව විසින් ගෙවා තිබුණි.

## 3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2009 වර්ෂයේ දී රු.4,000,000 ක වියදමින් ආරම්භ කර තිබුණු කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ කටයුතු අක්‍රීය තත්ත්වයෙන් පවතින බවත්, පිරිවැය රු.126,500 ක් වූ යන්ත්‍ර ප්‍රයෝජනයට නොගැනීම නිසා එම භූමියේ දිරාපත්වෙමින් පවතින බවත් දක්නට ලැබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

## 4.1 අයවැය පාලනය

අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 06 ක එකතුව රු.30,557,397 ක් වූ ඉතිරි කිරීම්ද, වියදම් විෂයයන් 03 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා එකතුව රු.29,368,191 ක වියදම් දැරීම්ද, ආදායම් විෂයයන් 05 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.116,196,264 ක් වීම යන හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

නිලධාරීන් 05 දෙනෙකු අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත කර වැටුප් හා දීමනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,232,251 ක වියදමක් දරා තිබුණද, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි හා 2014 පෙබරවාරි 04 දිනැති අංක දපපා/යහ/01/ න.ව.ලේ දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය පවත්වාගෙන නොයැම නිසා අදාළ භාණ්ඩ, උපකරණ හා ගොඩනැගිලි නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) **නිෂ්ක්‍රීය වාහන වත්කම්**

----------------------------

නාගරික කොමසාරිස්ගේ 2015 අගෝස්තු 10 දිනැති අංක ගා/මනස/මුවි/2013/3/76 දරන ලිපිය පරිදි රු.140,000 ක අවම ලංසුවක් යටතේ මහා නගර සභාව සතු එක්ස්කැවේටර් (Takeuch Excavator) යන්ත්‍රය අපහරණය සඳහා මූලික පියවර ගෙන ඇති බව දන්වා තිබූ නමුත්, 2016 අප්‍රේල් 27 දින වනවිටත් එම යන්ත්‍රය කසල බැහැර කරන ඉඩමේ දිරාපත් වෙමින් පැවතුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) ණයගැති හා ණයහිමි පාලනය
(උ) වාහන පාලනය
(ඌ) සේවක මණ්ඩල කළමනාකරණය